රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

## 2024-09-13 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. ශ්‍රී ලංකාවේ වෙළෙඳ පහසුකරණය සඳහා වූ මාර්ග සිතියම

ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) වෙළෙඳ පහසුකරණ ගිවිසුම (TFA) බලාත්මක කොට එහි ඇතුළත් බැඳීම් 36ක් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධයෙන් ආයතනවල අන්තර් සම්බන්ධීකරණය සිදු කිරීම සඳහා ජාතික වෙළෙඳ පහසුකරණ කමිටුවක් පිහිටුවීමට 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ යටතේ 2017-2030 කාලසීමාව තුළ වෙළෙඳ පහසුකම් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව කැප වී සිටී. කලාපයේ රටවල් විසින් එම සැලැස්මේ සමස්ත කැපවීම්වලින් ඉහළ ප්‍රතිශතයක් සපුරා ඇති නමුත්, ශ්‍රී ලංකාව විසින් සමස්ත කැපවීම්වලින් 37.4%ක් පමණ සපුරා ඇත. එම තත්ත්වය සැලකිල්ලට ගෙන, වෙළෙඳ පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග පිළිබඳව සම්පූර්ණ තක්සේරුවක් සිදු කර, ප්‍රමුඛතා ක්‍රියාමාර්ග වේගවත් පදනමකින් ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි, ස්වාධීන නිර්දේශ ලබා දීම සඳහා ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයේ තාක්ෂණික විශේෂඥතාවයෙන් යුක්තව ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයෙන් තාක්ෂණික සහාය ඉල්ලා ඇත. ඒ අනුව, රාජ්‍ය සහ පෞද්ගලික පාර්ශ්වකරුවන් 200කගේ පමණ සහභාගිත්වයෙන් "ශ්‍රී ලංකාව සඳහා වෙළෙඳ පහසුකරණ මාර්ග සිතියම" සහ "වෙළෙඳ පහසුකරණ ක්‍රියාකාරී සැලැස්ම 2025-2028" සකස් කරනු ලැබ තිබේ. එකී මාර්ග සිතියම අනුගමනය කිරීම පිණිස සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ශ්‍රී ලංකාවෙහි ITC SheTrades Hub ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම

ජාත්‍යන්තර වෙළෙඳාම තුළ ශ්‍රී ලංකාවේ කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාරවල (WLBs) සහභාගිත්වය සහ තරගකාරිත්වය වැඩි කිරීම සඳහා, "ශ්‍රී ලංකාව තුළ ITC SheTrades Hub" ආරම්භ කිරීමට ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය (ITC) සමඟ මූල්‍යමය නොවන අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් යෝජනා කර

තිබේ. එමඟින්, කාන්තා ව්‍යවසායකයින්ට වෙළෙඳපොළ හා ආයෝජන අවස්ථා වැනි ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළ මාතෘකා පිළිබඳ පුහුණුවීම් ලබා ගැනීමට සහ අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය අතර යෝජිත අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. IFC Colombo 1 හා Gateway International Campus ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාර ලෙස නම් කිරීම**

ව්‍යාපාරයක්, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීම සඳහා සහ එකී ව්‍යාපාරය වෙත නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු බවට 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන යටතේ නියම කරනු ලැබ ඇත. එකී විධිවිධාන යටතේ බලයලත් තැනැත්තන් වශයෙන් අනුමත කරනු ලැබ ඇති IFC Colombo 1 (PVT) LTD සහ Gateway International Campus (PVT) LTD ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාර ලෙස නම් කිරීමටත්, එකී ව්‍යාපාර සඳහා යෝජිත නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමටත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. ක්ෂයරෝග ආසාදිතයන් අතර නිවාරණ ප්‍රතිකාර වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කිරීම**

ශ්‍රී ලංකාවේ දෙවන ප්‍රමුඛතම බෝවන රෝගය ක්ෂය රෝගය වන අතර, බෝවන රෝග මඟින් සිදුවන මරණවලට ප්‍රධානම හේතුව ද එය වේ. 2021 වර්ෂයේදී, ක්ෂය රෝග නිවාරණ ප්‍රතිකාරය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව ශ්‍රී ලංකාව සඳහා ද මාර්ගෝපදේශයක් නිර්මාණය කර ඇත. ඒ අනුව, ක්ෂයරෝග මර්දන සහ ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත සත්කාර ආකෘතියේ ඵලදායිතාව නිරීක්ෂණය කිරීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කය තුළ අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් 387,280ක මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට ක්ෂය රෝගය සහ පෙනහළු රෝග පිළිබඳව ක්‍රියා කරනු ලබන ජාත්‍යන්තර සංගමය එකඟතාව පළ කර ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

වෛද්‍ය පීඨය සමඟ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්ෂයරෝග මර්දන සහ ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන එක්ව එකී අධ්‍යයනය සිදු කරනු ඇත. ඒ අනුව, එම අධ්‍යයනය සිදු කිරීම සඳහා ක්ෂය රෝගය සහ පෙනහළු රෝග පිළිබඳව ක්‍රියා කරනු ලබන ජාත්‍යන්තර සංගමය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. නාගරික සංවර්ධන අධිකාරියට අයත් වරිපනම් අංක 135, පෙරහැර මාවත, කොල්ලුපිටිය, කොළඹ 03හි පිහිටි ඉඩම් කොටස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා 99 අවුරුදු බදු පදනම මත බැහැර කිරීම**

නාගරික සංවර්ධන අධිකාරියට අයත් පෙරහැර මාවත, කොල්ලුපිටිය, කොළඹ 03හි පිහිටි රූඩ් 02 පර්චස් 35.95ක ඉඩම් කොටසක් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා 99 අවුරුදු බදු පදනම මත බැහැර කිරීම සඳහා උනන්දුවක් දක්වන ආයෝජකයින්ගෙන් යෝජනා කැඳවා ඇත. ඒ අනුව තෝරා ගනු ලැබ ඇති ග්ලෝබල් ලීසිං ලිමිටඩ් වෙත දීර්ඝකාලීන බදු පදනම මත අදාළ ඉඩම් කොටස බැහැර කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර සාකච්ඡා සම්මුති කමිටුවේ අනුමැතිය ලැබී තිබේ. එම සමාගම වෙත එකී ඉඩම් කොටස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 99 අවුරුදු බදු පදනම මත ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. ශ්‍රීලංකන් ගුවන් සේවයේ සම්බන්ධක නැවතුම් සේවා සඳහා මෙහෙයුම් හැසිරවීමේ නියෝජිතවරයෙකු තෝරා ගැනීම**

ශ්‍රීලංකන් ගුවන් සේවයේ සම්බන්ධක නැවතුම් සේවා සඳහා මෙහෙයුම් හැසිරවීමේ නියෝජිතවරයෙකු තෝරා ගැනීම පිණිස ජාතික තරගකාරී ලංසු ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි සාරානුකූලව ප්‍රතිචාර දැක්වූ එකම ලංසුකරු වන Lanka Sportreizen වෙත අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **දහම් පාසල් ගුරුභවතුන් සඳහා නිල ඇඳුම් ලබා දීම**

බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි හා කතෝලික දහම් පාසල් ගුරුභවතුන් සිදු කරන සේවය අගය කරමින් ඔවුන් දිරිගැන්වීම සඳහා මේ වන විට රුපියල් 5,000/-ක වාර්ෂික ගුරු දීමනාවක් ගෙවනු ලැබේ. එම දීමනාවට අමතරව, 2022 වර්ෂය දක්වා දහම් පාසල් ගුරුභවතුන් සඳහා නිල ඇඳුමක් ලබා දී ඇති අතර, මේ වන විට නිල ඇඳුම් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක නොවේ. දහම් පාසල් ගුරුභවතුන් සඳහා නිල ඇඳුම් ලබා දීම සම්බන්ධයෙන් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාවක් සැලකිල්ලට ගෙන, 2025 වර්ෂයේදී සියලු ආගම් නියෝජනය කරනු ලබන දහම් පාසල් ගුරුවරුන් සඳහා රුපියල් 5,000/-ක දිරිගැන්වීමේ ගුරු දීමනාව සහ රුපියල් 2,500/-ක නිල ඇඳුම් දීමනාව වශයෙන් වාර්ෂිකව රුපියල් 7,500/-ක දීමනාවක් ලබා දීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

08. **මෙගාවොට් 1 සිට 5 දක්වා වන ධාරිතාවන්ගෙන් යුත් මෙගාවොට් 165ක් දක්වා වන මුළු ධාරිතාවකින් සමන්විත AC භූමිය මත ඉදිකෙරෙන සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා විදුලි බලාගාර ස්ථාපනය කිරීම**

ග්‍රිඩ් උපපොළවල් 20ක් සඳහා මෙගාවොට් 165ක් දක්වා ව්‍යාපෘති සංවර්ධනය කිරීම පිණිස ලංසු කැඳවා ඇති අතර, අනුරාධපුර, ගාල්ල සහ දෙණියාය ග්‍රිඩ් උපපොළවල් හැර අනෙකුත් ස්ථාන සඳහා වන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිණිස 2024-09-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. අනුරාධපුර, ගාල්ල සහ දෙණියාය ග්‍රිඩ් උපපොළවල් සඳහා අසාර්ථක ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර තිබූ අභියාචනා ප්‍රසම්පාදන අභියාචන මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කර තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශ මත පදනම්ව පහත සඳහන් පරිදි අදාළ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

| ස්ථානය | ධාරිතාව (මෙ.වො.) | කොන්ත්‍රාත්කරු |
|---|---|---|
| අනුරාධපුර ග්‍රිඩ් උපපොළ | 3 | Fentons Smart Facilities (Pvt) Ltd |
| | 3 | Hayleys Fentons Limited |
| | 2 | Nanila Publication (Pvt) Ltd |
| | 2 | Ceylex Renwable (Pvt) Ltd |
| ගාල්ල ග්‍රිඩ් උපපොළ | 1 | Austral Solar (Pvt) Ltd |
| දෙණියාය ග්‍රිඩ් උපපොළ | 3 | Fortune Green (Pvt) Ltd |
| | 5 | Solar One Asia (Pvt) Ltd |
| | 2 | Austral Solar (Pvt) Ltd |

09. **ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ජලාශ මත පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

පුනර්ජනනීය බලශක්ති උත්පාදනය ඉහළ නැංවීම සඳහා රජය විසින් දැනට පවතින ජලමූලාශ්‍ර මත පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීමට ප්‍රමුඛතාවක් ලබා දී ඇත. ඒ අනුව, පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා රන්දෙණිගල, මොරගහකන්ද සහ කලාවැව යන ප්‍රධාන ජලාශ 03ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් හඳුනා ගෙන තිබේ. එම ස්ථාන සම්බන්ධයෙන් මේ වන විට ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර ඇත. ඒ අනුව, රන්දෙනිගල, මොරගහකන්ද සහ කලාවැව ජලාශයන්හි පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ආයෝජකයින් තෝරා ගැනීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලය වෙත බලය පැවරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **වාහන ආනයනය සඳහා වන තාවකාලික තහනම ඉවත් කිරීම**

මෙරට විදේශ විනිමය වෙළෙඳපොළ මත වැඩි වෙමින් පැවති පීඩනය අවම කිරීමේ පියවරක් වශයෙන් සහ ඖෂධ, ඉන්ධන සහ ආහාර ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා පවතින විදේශ විනිමය බෙදා හැරීම සහතික කිරීම සඳහා කඩිනමින් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය 2020 මාර්තු මස සිට තාවකාලිකව අත්හිටුවා ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ එකඟ වී ඇති ප්‍රතිසංස්කරණ පියවර සමඟින් ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් වෙමින් පැවතීම සැලකිල්ලට ගෙන, සංයෝජිත වර්ගීකරණ

සංකේතාංක 304ක් යටතේ වර්ගීකරණය වන මෝටර් වාහන හා මෝටර් භාවිත නොවන භාණ්ඩ ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම පහත පරිදි ඉවත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* පොදු ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා රථ, විශේෂ කාර්යයන් සඳහා යොදා ගන්නා රථ සහ අනෙකුත් මෝටර් භාවිතා නොවන භාණ්ඩ 2024-10-01 දින සිට ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම.
* වාණිජමය හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා යොදා ගන්නා රථ 2024-12-01 දින සිට ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම.
* පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා මෝටර් වාහන (කාර්, වෑන්, ස්පෝර්ට් යුටිලිටි වාහන, පිකප් ආදිය) 2025-02-01 දින සිට ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම.

## 11. දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

කවර හෝ ආකාරයකට සිදු කරනු ලබන ශාරීරික දණ්ඩන තහනම් කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීමට සහ ඒ සඳහා සුදුසු නීති සම්පාදනය කිරීම පිණිස 2024-04-29 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 12. යෝජිත පුද්ගලික ආදායම් බදු ව්‍යුහය සංශෝධනය කිරීම

රජයේ බදු ආදායම ඉහළ නංවා ගැනීමේ ක්‍රමවේදයක් වශයෙන් 2023-01-01 දින සිට වාර්ෂික ආදායම් බදුවලින් නිදහස් වීමේ සීමාව රුපියල් මිලියන 1.2ක් ලෙසත්, ආන්තික බදු ප්‍රතිශතය 6% සිට 36% දක්වා වන ලෙසත් පුද්ගලික ආදායම් මත බදු අය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. එමගින්, රජයේ බදු ආදායම ඉහළ යාම සිදු වුවත්, පුද්ගලික ආදායම් බද්දට යටත් වූ පිරිස අතරින් වැඩි බලපෑමකට ලක් වූ මැදි ආදායම් ලබන පිරිසට යම් සහනයක් ලැබිය යුතු බවට ඉදිරිපත් වූ ඉල්ලීම් සලකා බලා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඒ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන ලදී. 2024 වර්ෂයේ මැද භාගය වන විට රජයේ බදු ආදායම් ඉලක්ක සාක්ෂාත් කර ගනිමින් පැවතීම සහ ඇතැම් රාජ්‍ය මූල්‍ය ඉලක්ක ඉක්මවා තිබීම එම සාකච්ඡාවලදී අවධානයට යොමු වී ඇත. ඒ අනුව, 2025-04-01 දින සිට පහත සඳහන් පරිදි කටයුතු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන පැනවීමට හැකි වන පරිදි 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* වාර්ෂික බදු නිදහස් ආදායම් සීමාව රුපියල් මිලියන 1.2ක් ලෙස එලෙසම පවත්වාගෙන යාම.

* බදු අය කළ හැකි ආදායම් තීරණය කරනු ලබන පළමු බදු ස්ථරය රුපියල් 500,000/- සිට රුපියල් 720,000/- දක්වා ඉහළ නැංවීම.

* ඉන් අනතුරුව, පස්වන බදු ස්ථරය දක්වා වන සෑම බදු ස්ථරයක්ම රුපියල් 220,000/- බැගින් ඉහළ නැංවීම.

* 6% සිට 36% දක්වා වන දැනට පවතින බදු අනුපාතයන් නොවෙනස්ව පවත්වාගෙන යාම.

* ඒ අනුව, යෝජිත සංශෝධනයන්හි බලපෑම පහත සඳහන් පරිදි වනු ඇත.

| මාසික ආදායම (රු.) | දැනට අය කරන බද්දෙන් අඩු වන ප්‍රතිශතය |
|---|---|
| 150,000/- | 14% |
| 200,000/- | 20% |
| 300,000/- | 25% |
| 400,000/- | 23% |
| 500,000/- | 15% |
| 750,000/- | 8% |
| 1,000,000/- | 6% |

**13. යටත්විජිත යුධ අධිකරණයේ තීන්දුවක් මත වසර 109කට පෙර අසාධාරණ නඩු විභාගයකින් අනතුරුව මරණයට පත් කරනු ලැබූ දියුණුගේ එඩවඩ් හෙන්රි පේද්‍රිස් මහතාට සමාව පිරිනැමීම**

ශ්‍රී ලංකාවේ යටත්විජිත පාලන අධිකාරිය විසින් රජයට එරෙහිව කැරලි කෝලාහල සහ රාජද්‍රෝහී ක්‍රියාවන් සිදු කළේ යැයි චෝදනා එල්ල කරමින් යුද අධිකරණයක් හමුවට පමුණුවා, රාජද්‍රෝහී චෝදනාවට වරදකරු කොට, එවකට 27 වියැති දියුණුගේ එඩවඩ් හෙන්රි පේද්‍රිස් මැතිතුමා 1915-07-07 දින කිසිදු අභියාචනයක් නොසලකා මරණ දඬුවමට ලක් කරනු ලැබ ඇත. මිය ගිය හෙන්රි පේද්‍රිස් මැතිතුමාගේ දේහය, යුද නීතිය යටතේ වරදකරු වූ අපරාධකරුවෙකු ආදාහනය කිරීමට නියම කර ඇති ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින්, හෙළි නොකළ පරිශ්‍රයක ආදාහනය කර තිබේ. එතුමාගේ ඝාතනය එවකට මෙරට පාලනය කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් සිදු කරන ලද සැලැස්මක ප්‍රතිඵලයක් වශයෙන් පසුව හඳුනා ගනු ලැබ තිබේ. ඒ අනුව, අසාධාරණ නඩු විභාගයකින් අනතුරුව 1915-07-07 දින නීතිවිරෝධී අයුරින් මරණයට පත් කරනු ලැබූ දියුණුගේ එඩවඩ් හෙන්රි පේද්‍රිස් මහතාට මරණින් පසු ජනාධිපති සමාව පිරිනමන ලද බවට නිකුත් කරන ලද අංක 2401/23 දරන 2024-09-12 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය අමාත්‍ය මණ්ඩලයේ අවධානය පිණිස ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ගරු ජනාධිපතිතුමා විසින් ගනු ලැබ ඇති පියවර සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දෙන ලදී.

***********